සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

බුද්ධ ධර්මය - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. බෞද්ධ ප්‍රතිපදාවේ දොරටුව වන්නේ,
    1. අමූලිකාවයි. 2. භක්තියයි. 3. ශ්‍රද්ධාවයි. 4. තුණුරුවනයි.

02. සිදුහත් කුමාරයාට ශිල්ප ශාස්ත්‍ර ලබා දුන් බමුණු පඬිවරයා වූයේ,
    1. තිවංක බමුණාය. 2. සර්වමිත්‍ර බමුණාය. 3. අසිත බමුණාය. 4. ද්‍රෝණ බමුණාය.

03. බුදු දහමේ ප්‍රධාන භාවනා ක්‍රම දෙකකි. එයින් සමථ භාවනාව හැඳින්වීම පිණිස යෙදෙන පර්යාය පදය කුමක් ද?
    1. ප්‍රඥා භාවනාව 2. විපස්සනා භාවනාව 3. චිත්ත භාවනාව 4. ත්‍රිලක්ෂණ භාවනාව

04 පාප මිත්‍ර සේවනය නිසා අසූකෝටියක ධනයට උරුමකම් කියූ අවසානයේ ඉන බැඳිවතට පමණක් සීමාවී අපමණ දුක් වින්දේ,
    1. ඉල්ලීස සිටුවරයා ය. 2. මහධන සිටුවරයා ය.
    3. අනේපිඬු සිටුවරයා ය. 4. අදින්න පුබ්බක සිටුවරයා ය.

05. දහඩිය මහන්සියෙන් උපයාගත් වස්තුව නිවැරදිව පරිහරණය නොකළහොත්, එම සම්පත් විනාශවන දොරටු හයක් සිඟාලෝවාද සූත්‍රයේ දක්වා ඇත. එම කරුණුවලට අයත් නොවන කරුණක් වන්නේ,
    1. පවිටු මිතුරන් ඇසුරු නොකිරීම.
    2. සූදුවෙහි යෙදීම.
    3. මධ්‍යසාර භාවිතා කිරීම.
    4. අවේලාවේ වීදි සංචාරය.

06. බුදු දහමේ අර්ථචර්යාව යනුවෙන් අදහස් කරන්නේ,
    1. තමන්ගේ දියුණුව පිණිස කටයුතු කිරීමයි.
    2. අනුන්ගේ යහපත, දියුණුව පිණිස කටයුතු කිරීමයි.
    3. තමන්ගේ හා අනුන්ගේ දියුණුව නොපැතීමයි.
    4. ඥාතීන්ගේ යහපත පැතීමයි.

07. ''අගතිය'' යනු නීතියට, යුක්තියට පටහැනිව ක්‍රියා කිරීමය. එසේ කිරීමට පාලකයා පොළඹවන කරුණු හතරකි. එනම්,
    1. ලාභ, අලාභ, නින්දා, ප්‍රශංසා වේ.
    2. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා වේ.
    3. ඡන්ද, චිත්ත, විරිය, විමංසා වේ.
    4. ඡන්ද, ද්වේශ, භය, මෝහ වේ.

Past Papers Wiki

08. බුදුරදුන්ගේ දේශනාවට අනුව අකුසල කර්ම හෙවත් සසර දුක් උපදවන නරක අවැඩදායක සචේතනික ක්‍රියා,
1. සිව් වැදෑරුම් ය. 2. අට වැදෑරුම් ය. 3. නව වැදෑරුම් ය. 4. දස වැදෑරුම් ය.

09. වෙනත් කර්මයකින් වළකාලිය නොහැකි වඩාත් ශක්තිමත් බලසම්පන්න කුසලාකුසල කර්මයෝ හැඳින්වෙන නාමය කුමක් ද?
1. ආචිණ්ණ කර්මය. 2. ගරුක කර්මය. 3. ජනක කර්මය. 4. ආසන්න කර්මය.

10. මහරහත් අස්සජී තෙරණුවන් හමුවී ''ඔබ වහන්සේ පැවිදි වූයේ කවරෙකු උදෙසා ද? ඔබ වහන්සේගේ ගුරුතුමා කවරෙක් ද? කාගේ දහමක් ද, ඔබ වහන්සේ රුචි කරන්නේ'' යනුවෙන් ප්‍රකාශ කළේ,
1. උපක නම් මානවකයා ය.
2. කෝලිත නම් මානවකයා ය.
3. උපතිස්ස නම් මානවකයා ය.
4. සුභ නම් මානවකයා ය.

11. සද්ධර්ම රත්නාවලිය කෘතිය රචනා වූ යුගය හා කතුවරයා වන්නේ,
1. දඹදෙණි යුගයේ බුද්ධපුත්‍ර හිමියෝ ය.
2. පොළොන්නරු යුගයේ විද්‍යාචක්‍රවර්තී පඬිතුමා ය.
3. කෝට්ටේ යුගයේ ගුරුළුගෝමී පඬිතුමා ය.
4. දඹදෙණි යුගයේ ධර්මසේන හිමියෝ ය.

12. ඉන්දියාවේ අජන්තා සිතුවම්වලට නැකම් කියන, සිතුවම් කලාවේ අපූර්වත්වය පෙන්නුම් කරන, අනුරාධපුර යුගයේ නිර්මාණය වූ චිත්‍ර ඇති ස්ථානය වන්නේ,
1. සීගිරිය ය. 2. මැදවල ය. 3. දිඹුලාගල ලෙන් ය. 4. කැළණි විහාරයේ ය.

13. භාරතයේ පැවති කණිෂ්ක රජුගේ අනුග්‍රහය මත පැවැත්වූ සිව්වන සංගායනාවේ මූලිකත්වය දැරුවේ,
1. ධර්ම ඛෝධි තෙරුන් ය. 2. ධර්මරුචි තෙරුන් ය.
3. වසුමිත්‍ර තෙරුන් ය. 4. හියුං සියෑං තෙරුන් ය.

14. පටිච්ච සමුප්පාද යන යෙදුමෙන් ම නොකියවෙන්නේ,
1. හේතු සහිත බව ය. 2. අහේතුක බව ය. 3. සහේතුක බව ය. 4. හේතුඵල දහම ය.

15. බුදුරජාණන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි දී පස්වග තවුසන් අමතා සිදුකළ මංගල ධර්ම දේශනාව වූයේ,
1. දම්සක් පැවතුම් සූත්‍රයයි. 2. රතන සූත්‍රයයි.
3. මංගල සූත්‍රයයි. 4. මෙත්ත සූත්‍රයයි.

16. ''ආරෝග්‍යා පරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං'' මෙම ගාථාව ඇතුළත් ග්‍රන්ථය කුමක් ද?
1. ධම්ම පදය. 2. යාගු සූත්‍රය. 3. ද්‍රෝණ සූත්‍රය. 4. භාරද්වාජ සූත්‍රය.

17. අනුන්ගේ අත් උදව් නැති ව නැගිටින්නට බැරිතරමට අධික ව ආහාර ගන්නා තැනැත්තා හඳුන්වන්නේ,
1. භුත්තවමිතක නමිනි. 2. ආහාර හත්ථක නමිනි.
3. කාකමාසක නමිනි. 4. අලංසාටක නමිනි.

18. උතුම් අරමුණක් පෙරදැරිව සිදුකළ සංගායනා පිළිබඳ ව ශාසන ඉතිහාසයේ සඳහන් වේ. ඒ අනුව ථේරවාදී බෞද්ධ සම්ප්‍රදාය මගින් පැවැත් වූ සංගායනා ගණන,
1. 03 කි. 2. 05 කි. 3. 06 කි. 4. 08 කි.

19. බුදු රජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රය දේශනා කිරීමේ දී උතුරු දිසාවට උපමා කර ඇත්තේ,
1. හිත මිතුරන් ය. 2. දෙමාපියන් ය. 3. ගුරුවරුන් ය. 4. සේවකයන් ය.

20. ''ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති'' යන පාළි පාඨයේ අදහස නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.
    1. මෙය ඉපදීමෙන් මෙය උපදී.
    2. මෙය නැතිවී යාමෙන් මෙය නැතිව යයි.
    3. මෙය ඇති කල්හි මෙය වේ.
    4. මෙය නැති කල්හි මෙය නොවේ.

21. පංචස්කන්ධයේ එන උපමාවලට අනුව රූපය උපමා කර ඇත්තේ,
    1. පෙණ පිඩකට ය. 2. මායාවකට ය. 3. මිරිඟුවකට ය. 4. දිය බුබුලකට ය.

22. ශ්‍රී ලාංකික ශාසන ඉතිහාසයේ පළමුවරට නිකාය භේදයක් ඇතිවීමට බලපෑ හේතුව වූයේ අභයගිරිය පෞද්ගලික පූජාවක් ලෙස මහාතිස්ස හිමිට පිළිගැන්වීමයි. එම පූජාව සිදුකළේ කිනම් රජු ද?
    1. දුටුගැමුණු රජතුමා. 2. මහසෙන් රජතුමා.
    3. තිස්ස රජතුමා. 4. වළගම්බා රජතුමා.

23. ''අප්‍රියයන් හා එක්වීමටත්, ප්‍රියයන්ගෙන් වෙන්වීමටත්, සියලු මිනිසුන්ට උරුම ය.'' මෙම අදහස් ප්‍රකාශ වන්නේ සිව්සස් දහම් තුළ කුමන අංගයෙන් ද?
    1. දුක්ඛ සත්‍යයට ය. 2. සමුදය සත්‍යයට ය.
    3. නිරෝධ ගාමිණී පටිපදා සත්‍යයට ය. 4. නිරෝධ සත්‍යයට ය.

24. බුදුරජාණන් වහන්සේ විසින් ගිරිමානන්ද ස්වාමීන් වහන්සේට රෝග වැළඳීමට හේතුවන කරුණු පැහැදිලි කරමින් ගිරිමානන්ද සූත්‍රය දේශනා කළහ. එහි අඩංගු කරුණු ගණන,
    1. දෙකකි. 2. හතරකි. 3. හතකි. 4. අටකි.

25. භාවනාව සඳහා යොමු වීමේ දී ඇති නොකරගත යුතු ගුණාංග අතරට අයත් නොවන්නක් වන්නේ,
    1. ඉන්ද්‍රිය සංවරයයි. 2. සති සම්පජඤ්ඤයයි.
    3. මහිච්ඡතාවයයි. 4. සන්තුට්ඨිතාවයයි.

26. බුදු දහමේ උගන්වන සිත කිලිටි කරන අකුසල මූලයක් වන්නේ,
    1. ලෝභ, දෝස, මෝහ. 2. සීල, සමාධි, ප්‍රඥා.
    3. කාම, භව, විභව. 4. අලෝභ, අදෝස, අමෝහ.

27. සමාජයේ සිටින ඇතැම් පුද්ගලයන් ඉතා නොදියුණු අවම පෞරුෂ ඇත්තෝය. ඔවුන් උපමා කර ඇත්තේ,
    1. පිපුණු නෙළුම් මල් වලටය.
    2. මඩෙහි ගැලී සිටින නෙළුම් පොහොට්ටු වලටය.
    3. ජලයෙන් ඉහළට මතු වූ නෙළුම් පොහොට්ටු වලටය.
    4. ජලයෙන් පහළට වූ නෙළුම් පොහොට්ටු වලටය.

28. තමා විසින් කරන ලද සියලු යහපත් ක්‍රියා සිය පින් පොතෙහි සටහන් කර තැබූ රජතුමා වූයේ,
    1. දුටුගැමුණු රජතුමා ය. 2. ධාතුසේන රජතුමා ය.
    3. මිහිඳු රජතුමා ය. 4. දේවානම්පියතිස්ස රජතුමා ය.

29. ''සීමාව හෙවත් ප්‍රමාණය දැන ආහාර වැළඳූ විට ආහාර සෙමින් දිරයි. ඔවුන්ගේ ආයුෂ ද වැඩෙන්නේ ය.'' මෙම කරුණ ඇතුළත් සූත්‍රය වන්නේ,
    1. දෝණපාක සූත්‍රය. 2. තේවිජ්ජ සූත්‍රය. 3. පරාභව සූත්‍රය. 4. ආහාර සූත්‍රය.

30. විද්වතුන්ගේ සම්භාවනාවට ලක් වූ කලාත්මක මුරගල හමුවන්නේ,
1. ජේතවනයේදී ය.
2. බිසෝ මාලිගාවේදී ය.
3. ලෝවාමහා ප්‍රාසාදයේදී ය.
4. අභයගිරි රත්නප්‍රාසාදයේදී ය.

31. බෝසත් උපත සඳහා දේවාරාධනාව ලැබූ පසු බෝසත්වරයෙකු පූර්ව අධ්‍යයනයක් කරනු ලබයි. එය හඳුන්වනු ලබන්නේ,
1. පංචස්කන්ධය යනුවෙනි.
2. පංච නීවරණ යනුවෙනි.
3. පංච මහා විලෝකනය යනුවෙනි.
4. පංච බලි යනුවෙනි.

32. තෙරුවනෙහි ගුණ ගණන,
1. නවයකි.
2. දහ අටකි.
3. විසි දෙකකි.
4. විසි හතරකි.

33. බුදු දහමේ පංච නීවරණ උපමා මගින් දක්වා ඇත. එහිදි ව්‍යාපාදය උපමා කර ඇත්තේ,
1. උතුරණ ජලයට ය.
2. පාසි සහිත ජලයට ය.
3. කැළඹුන ජලයට ය.
4. වර්ණ ජලයට ය.

34. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යනු,
1. සතර සංග්‍රහ වස්තු නම් වේ.
2. සිව්පසය නම් වේ.
3. සතර මහාභූත නම් වේ.
4. සතර බ්‍රහ්ම විහරණ නම් වේ.

35. ''සමග්ගා හෝථ මා විවදථ'' මෙහි සිංහල අර්ථය වන්නේ,
1. සංවරව කටයුතු කරන්න.
2. විවාදය අයහපත්ය.
3. සමගිවන්න විවාද නොකරන්න.
4. සමගියම යහපත්ය.

36. උද්ධච්ච කුක්කුච්ච නමින් හැඳින්වෙන්නේ,
1. කම්මැලිකම ය.
2. වැනෙන සුළු ගතිය ය.
3. උදාසීන බවය.
4. නොසන්සුන්කම හා පසුතැවිල්ලය.

37. නිවන් මඟ පසක් කිරීමට අවශ්‍ය වන මනා වූ පිළිවෙත් රකින බැවින් සඟ රුවන,
1. උජුපටිපන්න නම් වේ.
2. සාමීචිපටිපන්න නම් වේ.
3. සුපටිපන්න නම් වේ.
4. ඤායපටිපන්න නම් වේ.

38. ''කාය කම්ම'' සඳහා අදාළවන වරණය තෝරන්න.
1. පරුෂාවාචා..
2. අදත්තාදානය.
3. ව්‍යාපාදය.
4. පිසුනාවාචා.

39. ගුරුළුගෝමී පඬිවරයාගේ විශාරද දැනුම ප්‍රකට කරමින් රචිත ධර්ම ග්‍රන්ථය වන්නේ,
1. අමාවතුරයි.
2. ධර්ම ප්‍රදීපිකාවයි.
3. බුත්සරණයි.
4. බෝධි වංශයයි.

40. මාස ගණනක් බුදුරදුන් සමඟ එකට සිටිමින් උන්වහන්සේගේ පැවැත්ම පරීක්ෂා කළ අයෙකු වන්නේ,
1. පිප්ඵලී තරුණයා ය.
2. මඝ තරුණයා ය.
3. යස තරුණයා ය.
4. බ්‍රහ්මායු තරුණයා ය.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

10006102

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

බුද්ධ ධර්මය - II

කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

01. (i) සුද්ධෝදන රජතුමා විසින් සිදුහත් කුමාරයාට වාසය කිරීමට ඉදිකර දුන් මාළිගා තුන නම් කරන්න.

(ii) ''නිබ්බුතා නූන සා මාතා - නිබ්බුතා නූන සො පිතා'' යන ගාථාව සම්පූර්ණ කරන්න.

(iii) ''රහසක් පවි නොකොට - කෙලෙසරයනුත් දුරු කොට'' යන කවියෙන් කියැවෙන්නේ බුදුරජාණන් වහන්සේගේ කිනම් බුදු ගුණය ද?

(iv) සිදුහත් බෝසතාණෝ කිං කුසල ගවේසීව සිටි සමයේදී හමු වූ අෂ්ට සමාපත්තිලාභියා කවුරුන් ද?

(v) නීවරණ අතරින් දෙකක් සඳහන් කරන්න.

(vi) බුදු දහමේ දැක්වෙන සිරිත් හා විරිත් යන්නෙහි අදහස ලියන්න.

(vii) සතර සංග්‍රහ වස්තු නම් කරන්න.

(viii) එංගලන්තයේ පාලි පොත් සමාගම ආරම්භ කරනු ලැබුවේ කවුරුන් ද?

(ix) ශ්‍රද්ධාවේ ප්‍රභේද දෙක ලියන්න.

(x) අනුරාධපුර යුගයට අයත් පැරණිම සිංහල පද්‍ය නිර්මාණ හමුවන්නේ කුමන ස්ථානයෙන් ද?

(ලකුණු 2X10 =20)

02. (i) ''මහලු කොස්වා ළිහිණියන්'' උපමාවට ගනිමින් දේශනා කරන ලද ධම්ම පද ගාථාව ලියා දක්වන්න.

(ii) එම ගාථාවේ අර්ථය ලියන්න.

(iii) ශිෂ්‍යය ජීවිතය සාර්ථක කර ගැනීමට උපදෙස් සපයන ග්‍රන්ථයක් ලෙස ධම්ම පදයේ ඇති වටිනාකම ඇගයීමකට ලක් කරන්න.

(ලකුණු 2+3+5 = 10)

03. (i) ත්‍රි ලක්ෂණය නම් කරන්න.

(ii) ඉහත දැක් වූ කරුණු අතරින් එක් කරුණක් පැහැදිලි කරන්න.

(iii) අනිත්‍ය ස්වභාවය සමස්ත ලෝකයාටම පොදුවන ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5 = 10)

04. (i) සිව්වන ධර්ම සංගායනාව හෙවත් අලු විහාර සංගායනාව පැවැත්වීමට හේතු වූ කරුණු දෙකක් ලියන්න.

(ii) එම ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය, සහභාගී වූ භික්ෂූ පිරිස හා සිදුකළේ කුමන රාජ්‍ය පාලන සමයේදැයි සඳහන් කරන්න.

(iii) එම ධර්ම සංගායනාව බුදු දහමේ චිරස්ථිතිය සඳහා කුමන ආකාරයෙන් බලපෑවේදැයි විස්තර කරන්න.

(ලකුණු 2+3+5 = 10)

05. (i) ගර්භයේ හැඩය අනුව දක්නට ලැබෙන ස්තූප ආකාර දෙකක් ලියා දක්වන්න.

(ii) ස්තූපයක රූප සටහනක් ඇඳ එහි කොටස් නම් කරන්න.

(iii) ශ්‍රී ලාංකික කලා ශිල්පීන්ගේ කලා නිර්මාණ රැක ගැනීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5 = 10)

06. (i) බුදු රජාණන් වහන්සේ දේශනා කරන ලද රාජ්‍ය පාලන ප්‍රතිපත්ති දෙකක් නම් කරන්න.

(ii) වජ්ජි රජ දරුවන් භාවිත කළ පාලන ප්‍රතිපත්ති අතරින් තුනක් ලියන්න.

(iii) මහජනතාවට යහපත් සේවාවක් සැපයීමට බෞද්ධ රාජ්‍ය සංකල්ප ඉවහල් වන අයුරු ඇගයීමට ලක් කරන්න.

(ලකුණු 2+3+5 = 10)

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

(i) වැලිවිට සරණංකර සංඝරාජ මාහිමි

(ii) සමථ භාවනාව

(iii) පොළොන්නරු යුගයේ චිත්‍ර

(iv) සද්ධර්ම රත්නාවලිය

(ලකුණු 5+5 = 10)

Past Papers Wiki

පිළිතුරු පත්‍රය - I කොටස

1 -(3)	2 -(2)	3 -(3)	4 -(2)	5 -(1)	6 -(2)	7 -(4)	8 -(4)	9 -(2)	10 -(3)
11-(4)	12 -(1)	13 -(3)	14 -(2)	15 -(1)	16 -(1)	17 -(2)	18 -(3)	19 -(1)	20 -(2)
21-(1)	22 -(4)	23 -(1)	24 -(4)	25 -(3)	26 -(1)	27 -(2)	28 -(1)	29 -(1)	30 -(4)
31-(3)	32 -(4)	33 -(1)	34 -(4)	35 -(3)	36 -(4)	37 -(3)	38 -(2)	39 -(2)	40 -(4)

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

II කොටස

01. i. රම්‍ය, සුරම්‍ය, සුභ
ii. නිබ්බුතා නූන සාතාරී - යස්සායං ඊ දිසෝපතී
iii. අරහං
iv. උද්දකරාම තවුසා (උද්දකරාමපුත්ත)
v. කාමච්ඡන්දය / ව්‍යාපාදය / ථීන මිද්ධ / උද්ධච්ච කුක්කුච්ච / විචිකිච්ඡාව
vi. • සිරිත් - කළ යුතු දේ (සමාදානය) • විරිත් - නොකළ යුතු දේ (විරමණය)
vii. දානය / ප්‍රිය වචනය / අර්ථ චර්යාව / සමානාත්මතාවය
viii. රිස් ඩේවිඩ්ස් පඬිතුමා
ix. ආකාරවතී ශ්‍රද්ධාව / අමූලිකා ශ්‍රද්ධාව
x. සීගිරිය

(ලකුණු 2X10 =20)

02. i. අචරිත්වා බ්‍රහ්ම චරියං - අලද්ධා යොබ්බනේ ධනං
ජිණ්ණ කොඤ්චාව ඣායන්ති - චීණ මච්චේව පල්ලලේ
ii. මෙළොව පරලොව සැපවත් බව මෙන්ම කෙළවර දුකින් මිදී ලබන නිවන් සුවය ද උදා කරන උතුම් සීලා දී පිළිවෙත්හි ද නොයෙදී තරුණ වියේ දී උපන් ධනය රැක ගැන්මෙන් හා නූපන් ධනය ඉපදවීමෙන් ද තොරව ජීවත් වන්නෝ වැසි සමයෙහි මසුන් අල්ලා නොගෙන පසුව සිඳී ගිය පොකුණ දෙස බලා පසු තැවිලි වන මහලු කොස්වා ළිහිණියන් මෙන් පසු තැවෙන්නෝ ය, සුසුම් ලන්නෝය.
iii. ධම්ම පදය වනාහී බෞද්ධයාගේ හස්ථසාර ග්‍රන්ථය හෙවත් අත්පොත ලෙස සැලකේ. බුද්දක නිකායට අයත් මෙම ධර්ම ධම්ම පදය බෞද්ධ උපදේශ ග්‍රන්ථයන් අතර ප්‍රමුඛතාවය ලබාගත් ග්‍රන්ථයක් බව පෙන්වා දිය හැකිය. වග්ග 26 ක් හා ගාථා හාරසිය විසිතුනක් අන්තර්ගත වන අතර එම සෑම ගාථාවකින්ම පාහේ යහගුණයෙන් පිරි ජීවන පදනමකට මං පෙත් පෙන්වාදෙයි. උත්සහය / මනා සිහිය / නිවැරදි ක්‍රියාවන් ඇති බව / සංයමය / හොඳ නරක තෝරා බේරා ගැනීම / දැහැමි අප්‍රමාදී බව ආදී ගුණාංග රැසක් වර්ධනය කර ගැනීමට ධම්ම පදයේ එන ''උට්ඨානවතෝ සතිමතෝ'' යන ගාථාව තුළින් මග පෙන්වයි. ආදී ලෙස ධම්මපද ගාථා උදාහරණ සඳහා ලබා දෙමින් සාර්ථකව ලියන ලද පිළිතුරකට පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2+3+5 = 10)

03. i. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම
ii. අනිත්‍ය :- අනිත්‍ය යනු ලොව පවත්නා සියල්ල වෙනස් වීමයි. ස්ථිර කිසිවක් නොමැති බවයි.
දුක්ඛ :- සසර පැවැත්ම මූලිකව දුක් සහිතව පැවතීම, ඉපදීම / මහලු වීම / ලෙඩ වීම / මරණය / ප්‍රියයන්ගෙන් වෙන්වීම / අප්‍රියන් හා එක්වීම / කැමති දේ නොලැබීම ආදී සියල්ල නිසා දුක හටගනියි. අනිත්‍ය සියල්ල දුක් සහිතය.
අනාත්ම :- මමය, මගේය යනුවෙන් ගත හැකි ආත්මයක් නැති වීම අනාත්මයයි. බුදු දහමට අනුව පුද්ගලයා යනු පංචස්කන්ධය, ඉන්ද්‍රියන් ධාතු, ආයතනවලින් සැදුම් ලද්දකි. ආදී ලෙස ත්‍රිලක්ෂණය විස්තර කර තිබීම ප්‍රමාණවත් වේ.
iii. • ලොව පවත්නා සියලු දෙය අනිත්‍යයි. අනිත්‍ය නිසා දුක් සහිතය. දුක් සහිත බැවින් අනාත්මය. මමය මාගේය නොවේ. ත්‍රි ලක්ෂණය යනු බුදු දහමේ එක මූලික ඉගැන්වීමක් වේ. කුමන දේශයක, කුමන කාලයක සිටියද ත්‍රිලක්ෂණය ලොව පවත්නා සියලු දෙනාටම බලපායි.
• ලොව පවත්නා සියල්ලෝම දුකට පත් වේ. වෙනස්වීමට හේතු වේ. මරණයට පත් වේ. ඇති වූ සියල්ල විනාශවන හේතුඵලවාදී සත්‍යයෙන් කිසිවෙකුට ගැලවිය නොහැක. ජාති, ආගම් ආදී සියලු භේද පසක දමා සමස්ත ලෝකයාට පොදු සනාථන දහමක් වේ. (ආදී ලෙස කරුණු ගොනු කර ඇති සාර්ථක පිළිතුරකට පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න.)

(ලකුණු 2+3+5 = 10)

04. i. • වළගම්බා රාජ්‍ය සමයේදී අභයගිරිය කරවා පූජා කිරීමත් සමඟ මතු වූ ශාසනික අර්බුදය.
• බැමිණිතියා නම් සාගතය පැවති සමය තුළ ත්‍රිපිටකධාරී මහතෙරුන් වහන්සේලා හා ධර්මය විනාශ වීමේ අවදානම.
• ඇතැම් භික්ෂූන් වහන්සේලා ශාසනික පිළිවෙතින් පිරිහී යාම ද සංගායනාවක් පැවැත්වීමට හේතු විය.
• මුඛ පරම්පරාවෙන් පමණක් පවත්වාගෙන යාම අපහසු බවත්, ත්‍රිපිටකය ලේඛනගත කිරීම එයට විසඳුමක් බව පදනම් වේ.
ii. • පැවැත්වූ ස්ථානය :- මාතලේ අලුහවිහාරයේ දී
• සහභාගී වූ භික්ෂූන් පිරිස :- 500 ක් භික්ෂූන් වහන්සේලා
• රාජ්‍ය සමය :- වළගම්බා රාජ්‍ය සමය
iii. • දීර්ඝ කාලයක් ත්‍රිපිටක ධර්මය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන ඒම නිසා එහි යම් විකෘතිතාවයක් ඇති වීමට තිබූ ඉඩකඩ මඟ හැරියාම.
• රට තුළ පැවති අභ්‍යන්තර අවුල් සහගත තත්ව වන බැමිණිතියා සාගතය, භික්ෂූන් උපැවිදිවීම, භික්ෂූන් වහන්සේලා නිකායාන්තර ලෙස බෙදී විවිධ මතවල පිහිටා ධර්මය විවරණය කිරීම, ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ

II කොටස - පිළිතුරු ඉතිරි කොටස

කිරීම නිසා පැවති අනාරක්ෂිත තත්වය මඟහැරී යාම ආදී තොරතුරු ඇතුළත් වී නම් සාර්ථක පිළිතුරක් සේ සලකන්න. (19 වන පාඩම - 104, 105 පිටු)

(ලකුණු 2+3+5 = 10)

05. i. ඝණ්ඨාකාර / ඝටාකාර / බුබ්බුලාකාර / ධාන්‍යාකාර / පද්මාකාර / ආමලකාකාර

ii.



iii.
- ශ්‍රී ලාංකීය සංස්කෘතියේ විශිෂ්ට බව විදහා දක්වන නිර්මාණ ලෙස කලා ශිල්ප දැක්විය හැක.
- වාස්තු විද්‍යාත්මක නිර්මාණ වූ ස්තූප, බුද්ධ ප්‍රතිමා, චිත්‍ර, මූර්ති, කැටයම්, ගෘහ නිර්මාණ දෙස් විදෙස් සමයේ ඇගයීමට ලක්වන සුවිශේෂ නිර්මාණ බව පෙන්වා දිය හැකිය.
- ලොවක් මවිත කළ පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම යුතුකමකි.
- මතු පරපුරට අතීත උරුමයන් දැක ගැනීමට අවස්ථාව ලබාදීම ඉන් සිදු වේ. මේවා ප්‍රෞඪ ඉතිහාසය තහවුරු කරන සාක්ෂි බැවින් නොසැලකිලිමත් බව නිසා විනාශ වීමට ඉඩ නොදිය යුතුයි.

(ඉහත කරුණු ද උපයෝගී කර ගනිමින් පිළිතුර සමස්තයක් ලෙස ගෙන ලකුණු පිරිනමන්න.) (20 පාඩම 116 පිටුව)

(ලකුණු 2+3+5 = 10)

06. i. දස සක්විතිවත් / සප්ත අපරිහානීය ධර්ම / සතර සංග්‍රහ වස්තු / සතර අගතියෙන් තොරවීම

ii.
- නිතර නිතර රැස්වීම.
- සමගිව රැස්ව, සමගිය සාකච්ඡා කොට, සමගිව විසිර යාම.
- පෙර නොපැනවූ නීති, නොපැනවීම හා පනවන ලද නීති කඩ නොකොට ආරක්ෂා කිරීම.
- වැඩිහිටියන්ට හා ඔවුන්ගේ අදහස්වලට ගරු කිරීම.
- කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම.
- වජ්ජි රාජ්‍යය ඇතුළත හා පිටත පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම හා කඩ නොකොට පුද සිරිත් පැවැත්වීම.
- තම රාජ්‍යයට පැමිණි හා පැමිණෙන පූජනීය උතුමන්ට පහසුකම් සැලසීම.

iii.
- රටක් පාලනය කරන පාලකයා ජනතාවට හිතෛෂී, ලෙන්ගතු අයෙක් විය යුතුයි.
- ජනතාව හා රජු අතර පිය පුතු සබඳතාවය පැවතිය යුතු බව බුදු දහම තුළ අවධාරණය කරයි. එවැනි සබඳතාවයක් ගොඩනගා ගැනීම මඟින් ඉතා සාමකාමී සන්සුන්, ගැටුම්වලින් තොර සාමය හා සමගිය ඇති රාජ්‍යයක් නිර්මාණය කිරීමට හැකියාව උදාවෙයි. දස සක්විතිවත්, සප්ත අපරිහානීය ධර්ම ආදිය එයට උපකාර වේ.
- රජු දැහැමි වීමට හා ජනතාවගේ හිත සුව පිණිස බුදුහිමියන් පෙන්වා දුන් බෞද්ධ රාජ්‍ය සංකල්ප හේතුවේ. එම සංකල්ප ඇසුරින් ගොඩ නැගූ පිළිතුරක් සඳහා පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න. (22 වන පාඩම 124, 130 පිටු)

(ලකුණු 2+3+5 = 10)

07. i. වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියෝ :- 1698 ජූනි 18 දින තුන්පනේ වැලිවිට ගමේ කුලතුංග බංඩාර නමින් උපත ලැබූ අතර වයස අවුරුදු 16 දී පැවිදි බිමට පත්විය. බොහෝ දුෂ්කරතා මධ්‍යයේ සිංහල, පාලි, සංස්කෘත, කාව්‍ය ශාස්ත්‍රය පිළිබඳ අධ්‍යාපනය ලැබීය. එකල උපසම්පදාව අහිමි යුගයකි. පිරිහීගිය භික්ෂු සමාජය දුරලා යලි උපසම්පදාව ඇති කොට ශාසනය ආරක්ෂා කර ගැනීමට සරණංකර හිමි මුල්විය. මේ නිසා කීර්ති ශ්‍රී රාජසිංහ රජු සංඝරාජ පදවියෙන් පුදනු ලැබීය. ''උඩඟු නොව මහණ'' යන නිහතමානී බවින් යුතු වූ අතර මුණිගුණාලංකාරය, සාරාර්ථ සංග්‍රහය, රතනත්‍රය ප්‍රණාම, ගාථා සන්නය, සතර බණවර සන්නය ආදී ග්‍රන්ථ රචනා කරන ලදී. ධර්ම ශාස්ත්‍රීය සේවාවක නිරත වී සිට 1778 ඇසල පොහෝ දින අපවත් විය.

ii. සමථ භාවනාව :- 10 ශ්‍රේණියේ 04 පාඩම (පිටු අංක 22, 26 දක්වා ඇසුරින් පිළිතුර සකස් වී තිබිය යුතුය.)

iii. පොළොන්නරු යුගයේ චිත්‍ර :- 10 ශ්‍රේණියේ 20 පාඩම (පිටු අංක 114 - 116 පිටු)
- විශාලතම චිත්‍රාවලිය තිවංක පිළිමගෙයින් හමු වේ.
- මහියංගණ ස්තූපයේ ධාතු ගර්භය, දිඹුලාගල ලෙන්, තිවංක පිළිමගෙය මෙම යුගයේ සිතුවම් හමු වේ ආදි ලෙස ලියන ලද පිළිතුරකට පිළිතුර සමස්තය සලකා ලකුණු ලබා දෙන්න.

iv. සද්ධර්ම රත්නාවලිය :- සද්ධර්ම නම් මිණිකැට ඇමිණූ මාලය යන අර්ථය ගෙන දෙන සද්ධර්ම රත්නාවලිය ධර්මසේන හිමියන්ගේ නිර්මාණයකි. ගැහි වහරට සමීප වූ උපමා උපමේය බහුලව යොදා ගනිමින් චරිත හා අවස්ථා නිරූපණය අතිවිශිෂ්ටය. ගැමි ජනයාට සමීප වහරකින් කථා රීතිය යොදා ගැනීම කතුවරයාට ආවේණික ලක්ෂණයකි. පාලි ධම්මපදට්ඨ කථාව ඇසුරෙන් රචනා කර ඇත. ආදී ලෙස කරුණු ගොනු කරමින් ලියන ලද පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න. (21 වන පාඩම 121 පිටුව)

(ලකුණු 5 x 2 = 10)

WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank